ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2015/03/31 |

## 2015 මාර්තු මාසයේ දී උද්ධමනය තවදුරටත් පහළ වැටිණි

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ (කො.පා.මි.ද.) (2006/07=100) විචලනය මගින් මනිනු ලබන උද්ධමනය ලක්ෂ්‍යමය පදනම මත 2015 පෙබරවාරි මස පැවැති සියයට 0.6 හි සිට 2015 මාර්තු මාසයේ දී සියයට 0.1 දක්වා පහළ වැටිණි. වාර්ෂික සාමාන්‍ය උද්ධමනය ද 2015 පෙබරවාරි මස වාර්තා කළ සියයට 2.9 හි සිට 2015 මාර්තු මාසයේ දී සියයට 2.5 දක්වා පහළ වැටිණි.



කො.පා.මි.දර්ශකය 2015 පෙබරවාරි මාසයේ සිට මාර්තු මාසය දක්වා සියයට 0.4 කින් පහළ වැටිණි. මාසය තුළ ආහාර මිල ගණන් පහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. බොහෝ එළවළු වර්ග, සහල්, තිරිඟු පිටි, සමහර කරවල වර්ග සහ බේකරි නිෂ්පාදනවල මිල ගණන් 2015 පෙබරවාරි මස පැවති මිල ගණන් සමග සැසඳීමේ දී පහළ වැටිණි. කෙසේ වුවද, මස්, සමහර නැවුම් මත්ස්‍ය වර්ග, පළතුරු, පොල් සහ පිළියෙළ කළ ආහාර වර්ගවල මිල ගණන් මෙම මාසය තුළ ඉහළ ගියේය.

2014 පෙබරවාරි මස පැවති අතුරු අයවැයට අනුව සිදු කළ එල්.පී. ගෑස් මිල සහ බස් ගාස්තු පහළ දැමීමේ සංශෝධනවල පූර්ණ බලපෑම හේතුවෙන් ආහාර නොවන කාණ්ඩයේ නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන; සහ ප්‍රවාහන යන උප කාණ්ඩවල මිල ගණන් පහළ ගියේය. කෙසේ වුවද, රෙදිපිළි හා පාවහන්; ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තු; සෞඛ්‍ය; විනෝදාත්මක හා සංස්කෘතික; සහ විවිධ භාණ්ඩ හා සේවා යන උපකාණ්ඩවල මිල ගණන්හි ඉහළ යෑමක් වාර්තා විය. අධ්‍යාපන සහ සන්නිවේදන උපකාණ්ඩවල සාමාන්‍ය මිල ගණන් මෙම මාසය තුළ නොවෙනස්ව පැවතිණි.

ආර්ථිකයෙහි යටිදැරි උද්ධමනය පිළිබිඹු කරන මූලික උද්ධමනය ලක්ෂ්‍යමය පදනම මත 2015 පෙබරවාරි මස පැවති සියයට 0.8 හි සිට 2015 මාර්තු මාසයේ දී සියයට 1.4 දක්වා ඉහළ ගියේය. වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2015 පෙබරවාරි මස පැවති සියයට 3.2 හි සිට 2015 මාර්තු මාසයේ දී සියයට 3.0 දක්වා පහළ වැටිණි.